# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120
ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


---

මගේ අංකය / எனது இலக்கம் / My NO – 1500 / 2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024
දිනය / திக / Date – 22/09/2024 පැය 1225

**විශේෂ මාධ්‍ය නිවේදනය**

**දිවයින පුරා පනවන ලද ඇඳිරි නීතිය ඉවත් කිරීම සහ සමකාමීව කටයුතු කරන ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටීම - පොලිස් මූලස්ථානය**

ගරු ජනාධිපතිතුමා විසින් මහජන ආරක්ෂක පනත යටතේ පැවරී තිබෙන බලතල ප්‍රකාරව 2024.09.21 වන දින රාත්‍රී 1000 සිට 2024.09.22 වන දින උදෑසන 0600 දක්වා පනවන ලද ඇඳිරි නීතිය නැවත 2024.09.22 වන අද දින දහවල් 1200 දක්වා දීර්ඝ කරන ලදී.

එම දීර්ඝ කරන ලද ඇඳිරි නීතිය අද දින දහවල් 1200 පසු අවසන් විය. මැතිවරණ දිනයේදී සමාකාමී වතාවරණයක් පැවතිනි. එම තත්ත්වය තවදුරටත් පවත්වා ගැනීමේ අරමුණින් මේ ආකාරයට ඇඳිරි නීතිය පනවා ඇති අතර එම කාල සීමාව තුළද සමකාමීව කටයුතු කිරීම සම්බන්ධයෙන් මහජනතාව වෙත ශ්‍රී ලංකාව පොලිසිය ස්තූතිය පුද කර සිටියි.

ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්කිරීමේ දින සිට මෙන්ම නාම යෝජනා භාර දී මැතිවරණ දිනය පැවැත්වීමේ දින දක්වාද, මැතිවරණ දිනයේදී ද ඉන් අනතුරුව පනවන ලද ඇඳිරි නීති කාල සීමාව අවසන් වන තුරුද සමකාමීව කටයුතු කරමින් මහජනතාව විසින් නීතිය හා සාමය පවත්වාගෙන යාමට පොලිසිය වෙත දක්වන ලද සහයෝගය අගය කර සිටිමු.

මැතිවරණය සඳහා ඉදිරිපත් වූ සියළුම අපේක්ෂක මහත්වරුන්, නියෝජිතයන්, ආධාරකරුවන් හා මාධ්‍ය ආයතන ඇතුළු සියළු දෙනා පොලිසිය සමග සම්බන්ධීකරණය වෙමින් නීතිය හා සාමය පවත්වාගෙන යාමට දක්වන ලද සහයෝගය සම්බන්ධයෙන් ඔවුන් වෙතද, අපගේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටිමු.

එසේම ත්‍රිවිධ හමුදාව, සිවිල් ආරක්ෂක බලකාය මැතිවරණ කටයුතු සඳහා අවශ්‍ය සම්බන්ධිකරණය සහ සහයෝගය නිරන්තරයෙන් ලබාදීම ශ්‍රී ලංකා පොලිසියට ශක්තියක් වූ අතර ඒ පිළිබඳව ත්‍රිවිධ හමුදාපතිවරුන්ටත්, සිවිල් ආරක්ෂක බලකා අණදෙන නිලධාරී මහතාටත් ශ්‍රී ලංකා පොලිසියේ ස්තූතිය පුද කර සිටින අතර මැතිවරණ කොමිෂන් සභාවද අවශ්‍ය අවස්ථා වලදී උපදෙස් ලබා දෙමින් දක්වන ලද සම්බන්ධිකරණය හා සහයෝගය පිළිබඳව විශේෂ ස්තූතිය පුද කර සිටිමු.

මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර දින 07 ක් යන තුරු වාහන හෝ පාගමන් පෙළපාලි පැවැත්වීම තහනම් වන අතර, කිසිඳු නීති විරෝධි ක්‍රියාවක් සිදු කිරීමට අවස්ථාව නොලැබේ. පොලිසිය මේ පිළිබඳ දැඩි අවධානය යොමු කර කටයුතු කරනු ඇත. එබැවින් තවදුරටත් නීතිය හා සාමය පවත්වාගෙන යාමට අවශ්‍ය සහය ලබා දෙන ලෙස මහජනතාවගෙන් පොලිසිය ඉල්ලා සිටියි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**